**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2016**

**-------------------------------------------**

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ඇසළ පෙරහැර භාරයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මහනුවර ඇසළ පෙරහැර භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහාභාරකරු භාරයේ පවත්නා රු.20,000,000ක මුදල සඳහා වාර්ෂිකව ලැබිය යුතු පොලී ආදායම භාරය වෙත ලබාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගන්නා ලද රු.60,000 ක් වටිනා පාවිච්චියට නොගත් නිර්වින්දන ඖෂධ තොගය, තොග යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට වියදමට කපාහැර තිබුණි.

### 2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනත** | |
| 8 (1) හා 9 වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ, සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන්, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා සහ ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව භාරය පරිපාලනය කිරීමෙහිලා කමිටුවේ සහාය ලබාගැනීමට නොහැකි වී තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 756 හා 2016 මාර්තු 31 දිනැති 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 4.1 ඡේදය | භාරයේ අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද අයවැය ලේඛනය පෙර වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් වියදම් දැරීමට බලය ලබා නොතිබියදී වැය විෂයයන් දෙකක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.135,652ක් වැය කර තිබුණි.

(ආ) ශ්‍රී දළදා මාළිගාවේ පෙරහැර සඳහා ආධාර වශයෙන් රු.1,000,000ක් 2016 අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කර තිබුණද, රු.1,500,000ක් ගෙවා තිබීම හේතුවෙන් රු.500,000ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව වැය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

-------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ මහනුවර ඇසළ පෙරහැර භාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,916,848ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.116,613ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,033,461ක වර්ධනයක් ඇති වී තිබුණි. ආසන පැනවීමේ ආදායම රු.3,599,600කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කාර්යසාධනය**

------------------

1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතට අනුව භාරයේ අරමුණු පහත දැක්වේ.

- වාර්ෂික ඇසළ පෙරහැර පැවැත්වීම පිණිස ශ්‍රී දළදා මාළිගාවට සහ සතර මහා දේවාලවලට මුදල් සහ වෙනත් ආධාර සැලසීම.
- පෙරහැරේ කලාත්මක සහ සංස්කෘතික අගය නංවාලන ජාතික කලා සහ නැටුම් දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.
- යම් කලාකරුවන්ගේ සහ ශිල්පීන්ගේ සේවා නිසා පෙරහැරේ සංස්කෘතික සහ කලාත්මක අගය වැඩිදියුණු විය හැකිද ඒ කලාකරුවන්ට සහ ශිල්පීන්ට මුදල් ආධාර සැලසීම.
- පෙරහැරේදී උපයෝගී කරගතයුතු භාණ්ඩ නිෂ්පාදනයේ නිරත වීම.

- පෙරහැරට සහභාගි වන කලාකරුවන් සහ නැටුම්කරුවන් සඳහා තරඟ පැවැත්වීම සහ ඔවුන්ට ත්‍යාග, සහතික සහ වෙනත් ආකාරයේ සම්මාන ප්‍රදානය කිරීම.

ඉහත අරමුණු වලින් පහත දැක්වෙන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(අ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේ කලාත්මක සහ සංස්කෘතික අගය නංවාලන ජාතික කලා සහ නැටුම් ප්‍රවර්ධනය කිරීම.

(ආ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේදී උපයෝගි කරගතයුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාරයේ රක්ෂණ භාරකරුවෙකු ලෙස මහා භාරකාරවරයා ගත් තීරණයක් පරිදි රු.20,000,000 ක මුදල් ප්‍රමුඛ බැංකුවේ තැන්පත් කර තිබුණි. එම බැංකුව බුන්වත් වීම නිසා ලද තැන්පතු මුදල මහා භාරකාරවරයා සන්තකයේ තබා ඇති නමුත් තැන්පත් කළ වටිනාකමට අදාළව සහතික පත්‍රයක් පෙරහැර භාරය වෙත විගණිත දිනය වූ 2017 අප්‍රේල් 28 දක්වාම නිකුත් කර නොතිබුණි. තවද මහනුවර ප්‍රාදේශීය ලේකම් අමතන ලද 2008 අගෝස්තු 29 දිනැති ශ්‍රී ලංකාවේ මහා භාරකරුගේ අංක PT/5/3/R/30/CT/5(1) දරන ලිපියේ 03 වන ඡේදය පරිදි ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ එම වර්ෂයට පවතින පොලී අනුපාතය පදනම් කරගෙන එම මුදල සඳහා පොලී මුදලක් පෙරහැර භාරය වෙත ලබාදෙන බව සඳහන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා පොලී මුදලක් භාරය වෙත ලැබී නොතිබුණි.

(ආ) භාරය සතු රු.මිලියන 1.1 ක අතිරික්ත මුදල වැඩි පොලී ප්‍රතිශතයක් සහිත ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කළ හැකිව තිබියදී 2012 නොවැම්බර් මාසයේ සිට සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් /423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

-----------------------------------------------

ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් හා සමාලෝචිත වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින් වර ඇසළ පෙරහැර භාරයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණය | |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| | | (ii) | ලෙජර් ගිණුම නිසි පරිදි පවත්වා නොගැනීම. |
| | | (iii) | වත්කම් ශේෂ ගිණුම්වලින් අත්හැරීම. |
| (ආ) | අයවැය ලේඛනමය පාලනය | | අයවැය හා සත්‍ය අගය අතර, විචලනයන් පැවතීම. |